<u>**පුරප්පාඩු**</u>

<u>**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - පරිපාලන හා මූල්‍ය තනතුරේ පවතින පුරප්පාඩු වෙනුවෙන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. <u>**අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)**</u> :

**සුදුසුකම් සහ පළපුරුදු**
<u>**බාහිර අයැදුම්කරුවන් (1 හෝ 2 හෝ 3)**</u>

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය

   **සමඟ**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

   **සහ**

   රාජ්‍ය අංශය/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

   **හෝ**

2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයේ පූර්ණ සාමාජිකත්වය.

   **සහ**

   රාජ්‍ය අංශයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද

   **හෝ**

3. ඉහත අංක 01 හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) I පන්තියේ නිලධාරියෙකුවීම.

<u>**අභ්‍යන්තර අයැදුම්කරුවන් (1 හෝ 2)**</u>

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.
2. කළමණාකාර I ශ්‍රේණියෙහි අදාළ තනතුරෙහි විෂය ක්ෂේත්‍රය තුළ තනතුරක වසර 5ට නොඅඩු සතුටුදායි සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය** - HM 1-1-2025 (රු.140,640-15x 4,100-202,140) (කළමනාකරණ සේවා චක්‍රලේඛ. 01/2025) සහ වෙනත් යෝජිත දීමනා

| | | |
|---|---|---|
| වයස | - | වයස අවු: 35ත් 55ත් අතර විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ. |

<u>බඳවාගැනීමේ ක්‍රමය :-</u> සම්මුඛ පරීක්ෂණයක් මඟින්

- අදාළ අතිරේක පළපුරුදු - ලකුණු 30
- අදාළ අතිරේක සුදුසුකම් - ලකුණු 30
- වෙනත් සුදුසුකම් - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණකේදී දක්වන කුසලතා - ලකුණු 25

සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු ප්‍රමුඛතාවය සලකා බලනු ලැබේ.

<u>බඳවා ගැනීමේ කොන්දේසි</u>

1. සියලු අයදුම්කරුවන් තනතුරේ රාජකාරී ඉටු කළ හැකි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාව සහ විශිෂ්ට සදාචාරාත්මක චරිතයක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. පත්වීම් ලාභීන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල හිමි වේ.
3. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ඉල්ලුම් කළ යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා අදාළ නිලධාරියා එම තනතුරට තෝරා ගන්නේ නම් ඔහු නිදහස් කරන බවට නිර්දේශ කළ යුතුය.
4. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් තෝරාගත් අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
5. ඉහත සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.
6. අයදුම්කරු තනතුරක් සඳහා අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලත් අයෙකු ලෙස සලකනු ලබන්නේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් පමණි.
7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් මණ්ඩලයට පමණක් පත්කිරීමේ බලය ඇත.
8. බාහිරව බඳවා ගන්නා පුද්ගලයින් වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ ස්ථානගත කරනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගන්නා පුද්ගලයින්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව තීරණය කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ ඥාතී නොවන නිර්දේශයන් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත් ජෛව දත්ත සහිත අයදුම්පත් 2025.05.08 දිනට හෝ ඊට පෙර "ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 04" යන ලිපිනයට යොමු කරන ලද ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුර අයදුම්පත අඩංගු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලිවිය/ටයිප් කළ යුතුය.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
10.04.2025